# වෙනස්වන සමාජය තුළ නූතන භික්ෂුවගේ කාර්යභාරය පිළිබඳව අධ්‍යයනයක්

- පූජ්‍ය මහකච්චකොඩියේ පඤ්ඤාසේකර හිමි

## හැඳින්වීම

ආදි බුදුදහමේ හමුවන පරමාදර්ශී සමාජය භික්ෂු සමාජයයි. භික්ෂුව යනු කුඩා වුවද මහත් වුවද ඥාති සමූහයාත් භෝගස්කන්ධයනුත් අතහැර අනාගාරිකව පැවිදි වූවෙකි **"සො අපරෙන සමයෙන අප්පංවා භොගක්ඛන්ධං පහාය මහන්තංවා භොගක්ඛන්ධං පහාය අප්පංවා ඤාතිපරිවට්ටං පහාය මහන්තංවා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජති".** [1] එසේ පැවිදි වන්නේ ගෘහ ජීවිතය කෙලෙස් දූවිල්ලෙන් ගැවසීගත්තක් ලෙස සලකා ගෘහ වාසයෙන් බඹසර නොවැසිය හැකි බව මෙනෙහි කොට පැවිද්ද සම්බාධක විරහිත අභ්‍යවකාශයක් මෙන් සිතාය. එසේ පැවිද්දව ස්වල්ප වූ ද වරදෙහි බිය දකිමින් ආචාර ගෝචර සම්පන්නව දිවි දෙවැනි කොට ශික්ෂාපද ආරක්ෂා කරයි. සිහිනුවණින් වෙසෙයි **"පාතිමොක්ඛ සංවරසංවුතො විහරති ආචාරගොචර සම්පන්නො අණුමත්තේසු වජ්ජෙසු භය දස්සාවි සමාදාය සික්ඛති සික්ඛාපදෙසු".** [2] ඒ නිසාම මේ ශාසනය කිසිදු ශ්‍රමණ සම්ප්‍රදායකට දක්නට නොමැති පරිදි සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අරහත් යන මාර්ගඵලලාභී ශ්‍රමණයන්ගෙන් යුක්ත වෙයි. එසේ නොමැතිව භික්ෂාටන අර්ථයෙන් පමණක් කඩ රෙදි අඳින අර්ථයෙන් පමණක් හෝ භික්ෂුවක් නොවන බව සැලකිය යුතුය. ඒවාද භික්ෂුවගේ ලක්ෂණයන්ය. වරක් බුදුරජාණන්



වහන්සේ හමුවට එන බමුණකු අසා සිටින්නේ මමත් ඔබ වහන්සේත් දෙදෙනාම භික්ෂකයෝ වෙමු. මෙහිලා අප දෙදෙනාගේ කවර වෙනසක් ද? යන්නයි. එහි දී බුදුරජාණන් වහන්සේ අනුන්ගෙන් සිඟන පමණින් භික්ෂුවක් නොවන බවත් භික්ෂුවක වන්නේ අකුශල ධර්මයන් බැහැර කිරීමෙන් බවත් දේශනා කළහ[3]. ශරීර පරිතාපනය හා ශරීර සන්තර්පණය යන ක්‍රියාවලින් දෙකෙන් ම විමුක්ත භික්ෂුව සරල දිවිපෙවතක් ගත කරන එහෙත් දුක්ඛ දෝමනස්සයන්ගෙන් වෙන් වූ තැනැත්තෙකි. උන් වහන්සේ අතීතය පිළිබඳව ශෝක කරන්නේ ද අනාගතය පිළිබඳ සිතුම් මවන්නේ ද නැත. වර්තමානය තුළ කළ යුතු කිස සපුරාලයි. එකී භික්ෂුව කය පරිහරණය කිරීමට සෑහෙන වීර්යෙනුත් කුස පරිහරණය කිරීමට සෑහෙන පිණ්ඩපාතයෙනුත් සෑහීමට පත් වෙයි. යම් තැනකට චාරිකාවෙහි යෙද්ද ගෙන යාමට ඇති බර පාත්‍ර සිවුරුවල බර පමණි. පක්ෂියෙකුට පියාපත් බර පමණක් ඇත්තා සේය.[4] සමාජ සංකීර්ණතා හමුවේ යම් යම් අවස්ථාවල භික්ෂූන් වහන්සේගේ විනය ශික්ෂාවන් සංසෝධනය කරන්නට යෙදුණි. එය සමාජ අවශ්‍යතාවයක් අනුව සිදුවූවක් බව හඳුනාගත හැකිය. ඒ අනුව පෙනී යන්නේ සමාජය වෙනස්වන විට භික්ෂූන් වහන්සේගේ කාර්යභාරයේද යම් යම් වෙනස්වීම් සිදු වූ බවයි.

## අරමුණු

වෙනස්වන සමාජය තුළ භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය පිළිබඳව අධ්‍යයනය කිරීමේ අරමුණු ලෙසින් පෙන්වාදිය හැක්කේ මුල් බුදුසමය තුළ භික්ෂූන් වහන්සේගේ ස්වභාවය පිළිබඳව හඳුනාගැනීමත්, බුද්ධ කාලයේ භික්ෂූන් වහන්සේට පනවා තිබූ විනය ශික්ෂා සමාජ අවශ්‍යතා මත වෙනස්වී ඇති ආකාරය හඳුනාගැනීමත්, ශ්‍රී ලංකාවේ භික්ෂු සමාජයේ ආරම්භය හා විකාශනය පිළිබඳව අධ්‍යයනය කිරිමත්, යම් යම් සතුරු ආක්‍රමණ කාලසීමාවන්වල භික්ෂූන් වහන්සේ මුහුණ දුන් අභියෝග හමුවේ භික්ෂු සමාජයේ ඇති වූ වෙනස්කම් අධ්‍යයනය කිරිමත්, වර්තමාන භික්ෂූන් වහන්සේගේ කාර්ය භාරය මුල් බුදුසමයෙන් වෙනස් වී ඇති ආකාරයත් ඒ සඳහා බලපාන ලද

හේතු සාධක පිළිබඳව අධ්‍යයනය කිරීමත් මෙම පර්යේෂණයේ අරමුණු වේ.

### අන්තර්ගතය

**බුද්ධ කාලයේ භික්ෂුවගේ කාර්යභාරය හා එය සමාජ අවශ්‍යතාවයන්ට අනුව වෙනස් වීම**

මුල් කාලීන භික්ෂුවගේ කාර්යභාරය වූයේ ධර්ම චාරිකාවේ නිරතවීමයි. ප්‍රථම රහත් හැටනම උදෙසා බුදුරජාණන් වහන්සේ දුන් අවවාදය වූයේ දෙදෙනෙකු එක මග නොයා බොහෝ දෙව් මිනිසුන්ගේ යහපත ද සලසමින් චාරිකාවේ හැසිරෙව් යන්නයි **"චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය......."**[5] මිනිසුන් දොස් නගද්දීත් භික්ෂූන් හේමන්තයේ ද ගිම්හානයේ ද වස්සානයේ ද චාරිකාවෙහි හැසිරුනු බවද සඳහන් වෙයි. මිනිසුන්ගේ බලවත් ඉල්ලීම මත භික්ෂූන් වහන්සේලා වස්සාන සමයේ චාරිකාවෙන් බැහැරව වන සෙනසුන්වල භාවනායෝගීව වැඩ සිටි අතර උන් වහන්සේලාට දායක පක්ෂය විසින් සිව්පසයෙන් ඇප උපස්ථාන කරන ලදි. මෙය පනවන ලද ශික්ෂාපදයන් කාලයේ අවශ්‍යතාවය මත ලිහිල් කරන ලද අවස්ථාවක් ලෙසින් හඳුනාගත හැකිය. එසේ සමාජ අවශ්‍යතා වෙනුවෙන් බොහෝ ශික්ෂාපදයන්වල වෙස්වූ ස්භාවයන් දැකිය හැකිය. මිනිසුන් විසින් ඉවතලන ලද රෙදි කැබලි අවුලාගෙන එයින් සාදාගත් පාංශුකූල චීවරය පමණක් මුලදී භික්ෂූන් වහන්සේ විසින් පාවිච්චි කරන ලදි. පසුව ජිවකයාගේ ඉල්ලීමකට අනුව ගිහියන්ගෙන් ලැබෙන වෙන සිවුරුත් පිළිගැනීමට බුදුහු අනුදත්හ. මෙසේ මුලින් පැවති ක්‍රමය වෙනස් වූ හෙයින් මිනිසුන් භික්ෂූන් වහන්සේට බොහෝ සිවුරු පූජා කරන්නට පටන් ගත්හ. සමහර විට මිනිස්සු සිවුරු පූජා කිරීමට විහාරයට ගොස් ඒවා පිළිගැන්වීමට භික්ෂුවක් නොලැබ ආපසු සිවුරු ගෙනගියහ. ඊට පසු බුදුන් වහන්සේ සිවුරු පිළිගැන්වීමට චීවරපටිග්ගාහක භික්ෂුවක් පත්කර ගන්නට අනුදත්හ. එතැන් පටන් සිවුරු පිළිගෙන නිසි පරිදි තැන්පත් නොකොට ඒ ඒ තැන්වල දැමුහ. සිවුරු විනාශ විය. එහෙයින් සිවුරු තැන්පත්



නොකොට තැබීමට චීවර නිදහක භික්ෂුවක් පත්කර ගැනීමට ඊළගට අනුදත්හ. එහෙයින් ඒ ඒ තැන්වල තිබූ සිවුරු මීයන් විසින් කන ලදි. ඒ නිසා සිවුරු ආරක්ෂා කරගැනීම සඳහා භාණ්ඩාගාරය රැක ගැනීමට භාණ්ඩාගාරික භික්ෂුවක් පත් කරගැනීමට අනුදත්හ. භාණ්ඩාගාරයේ දී සිවුරු එකතු වූ විට ඒවා බෙදා ගැනීමේ දී භික්ෂූන් අතර භේද ඇති විය. එනිසා සිවුරු බෙදාදීමට චීවරභාජක භික්ෂුවක් පත්කර ගන්නට අනුදත්හ. මේ අයුරින් සිවුරු පිළිබඳව තවතවත් දිගින් දිගට ශික්ෂා පද පැනවෙන්නට විය.[6]

සමහර විට ඒ ඒ අවස්ථාවලට ගැළපෙන පරිදි අනුප්‍රඥප්ති පැනවීමෙන් ඇතැම් ශික්ෂාපද නොඑක්වර වෙනස් කළ හැටි විනයේ හැම තැන ම පාහේ දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් කියතොත් ගණභෝජන ශික්ෂාපදය අවස්ථානුකූලව හත්වරක් අනුප්‍රඥප්ති පැනවීමෙන් වෙනස් කරන ලදි[7]. සමහර ශික්ෂාපද පළාත්වලට ගැලපෙන පරිදි ද වෙනස් කොට තිබෙන බැව් විනයෙහි සඳහන් වේ. මුලින් පනවා තිබුණු විනය ශික්ෂාවලට අනුව උපසම්පදා කර්මයට භික්ෂූන් දසනමක් අවශ්‍යය. එක හම්පටකට වඩා ඇති පාවහන් පාවිච්චි නොකළ යුතුය. සාමාන්‍යයෙන් පසලොස් දිනකට එකවරකට වඩා නෑම තහනම්ය. වාඩිවීමට හම් පාවිච්චි කිරීම තහනම්ය. මේ ශික්ෂාපද මෙසේ පනවා තිබියදීත් මහාකච්ඡායන ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය වූ අවන්ති ජනපදයෙන් පැමිණි සෝණ භික්ෂුව තම ආචාර්යයන් වෙනුවෙන් බුදුරජාණන් වහන්සේට මෙසේ දන්වා සිටියේය. අවන්ති පළාතේ භික්ෂූන් සොයා ගැනීම ඉතා අපහසුය. ඒ නිසා ඒ ප්‍රදේශයේ උපසම්පදාකර්මය භික්ෂූන් වහන්සේලා අඩු ගණනකින් කිරීමට අවසර දුන මැනවි. අවන්ති ජනපදයේ භූමිය ඉතා රළුය. ඒ නිසා ඒ පළාතේ පටවල් වැඩි ගණනකින් යුත් පාවහන් පාවිච්චියට අවසර දුන මැනවි. මධ්‍ය දේශයේ මිනිසුන් පැදුරු පාවිච්චි කරති. ඒ නිසා ආසන වශයෙන් හම් පාවිච්චියට අවසර දෙන ලෙසට ඉල්ලා සිටියාහ. මේ ඉල්ලීමට අනුව බුදුන් වහන්සේ භික්ෂු සංඝයා රැස්කොට කලින් පනවා තිබුණු ශික්ෂාපද අවන්ති දේශයට පමණක් නොව මධ්‍යදේශයෙන් පිට හැම රටවලට ම සාධාරණ පරිදි වෙනස් කළහ. එතැන් පටන්

මධ්‍යදේශයෙන් පිට පළාත්වල දි විනය උගත් භික්‍ෂුවක් ඇතුලු පස් නමකගෙන් උපසම්පදා කර්මය කිරීමටත් හම්පටවල් කීපයක් දමු පාවහන් පාවිච්චියටත්, නිතර නෑමටත් ආසන වශයෙන් හම් පාවිච්චියත් පටන් ගන්නා ලදි.[8] මෙසේ ආර්ථික හා සමාජීය වෙනස්වීම් අනුව කාලයටත් දේශයටත් අවස්ථාවටත් සුදුසු පරිදි ශික්‍ෂාපද පැනවීම් සහ වෙනස් කිරීම් සිදුවු බැව් විනය පිටකය පරීක්‍ෂාවෙන් කියවන විට පැහැදිලිව පෙනේ.

බුදුන් වහන්සේගේ පරිනිර්වාණයෙන් මාස තුනකට පසු සිදු වූ පළමුවන ධර්ම සංගායනාවේදී බුද්දානුබුද්ධක සික්ඛාපදයන් පිළිබඳ මේ ප්‍රශ්න ඉදිරිපත් විය. එහෙත් ඒ වන විට සමාජ ආර්ථික වශයෙන් විශාල වෙනසක් සිදු වී නොතිබුණු නිසා සික්ඛාපදයන්වල වෙනසක් සිදුවීමට අවශ්‍ය නොවීය. බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු සියයක් ගත වීමෙන් පසු ඉන්දියාවේ ආර්ථික සහ සාමාජීක වෙනසක් සිදු විය. මිනිසුන්ගේ සිතුම් පැතුම්වල ද විශාල වෙනසක් සිදු විය. මේ නිසාම විනය ශික්‍ෂාපදයන් වල භික්‍ෂු සංඝයා අතර මතභේදයන් පැවතුණි. විශේෂයෙන් ම වේසාලියෙහි වජ්ජි භික්‍ෂූන් වහන්සේ විසින් උපදවන ලද දශ වස්තූන් නිසා සංඝයා අතර කැලඹීමක් ඇති විය. වජ්ජි භික්‍ෂූන් විසින් උපදවන ලද දශ වස්තුව විනය විරෝධි බැව් යස, රේවත සහ සබ්බකාමී ස්ථවිරයන් වහන්සේලාගේ ප්‍රධානත්වයෙන් කාලාශෝක රජු දවස පවත්වන ලද දෙවන සංගායනාවේදී තීරණය කරගන්නා ලදි.[9] මේ තීරණය නොපිලිගත් සංඝයා එක් ව වෙන ම සංගායනාවක් පවත්වා මෙසේ නිකායෙන් වෙන් ව මහාසාංඝික නමින් නිකායක් විය. මෙසේ ධර්ම සහ විනය ප්‍රතිපත්තීන් පිළිබඳ මතභේදයන් නිසා ම ඊළග ශතවර්ෂය තුළ ථෙරීය නිකායේ කොටස් ද ඇතුලුව නිකාය 18 ක්ම පහළ විය.[10]

මෙසේ නොඑක් මතභේදයන් සහ නිකාය භේදයන් පහළවීම පිරිහීමේ නොව දියුණුවේ ලක්‍ෂණයක් බවත් බුද්ධාගම එක තැනක පල් නොවී, මරණයට කැප නොවී නව ජීවනයෙන් සහ දියුණු තියුණු ධෛර්යයෙන් යුතුව කාලයට සහ දේශයට යෝග්‍ය පරිදි වෙනස් වෙමින් පැතිරී යෑමේ ලකුණක් බවක් කල්කටා



විශ්වවිද්‍යාලයේ පාලිමහාචාර්ය බී. ඇම්. බරුවා කියයි.[11] 3 වන ධර්ම සංගායනාව බුදුදහමේ දියුණුව සඳහා ඇති වූ වැදගත් අවස්ථාවක් ලෙසින් පෙන්වා දිය හැකිය. අශෝක රජුගේ අනුග්‍රහය ඇතිව දක්‍ෂ විචක්ෂණ භික්‍ෂූන් සමූහයක් බුද්ධාගමත්, බෞද්ධ සංස්කෘතියත් පැතිරවීම සඳහා ධර්මදූතයන් වශයෙන් රටවල් නවයකට බෙදී ගියහ.[12]

## ශ්‍රී ලංකාවේ භික්‍ෂු ශාසනයේ ආරම්භය හා විකාශනය

ධර්ම ප්‍රචාරණය සිදු වූ රටවල් නවය අතරින් ශ්‍රී ලංකාව ඉතා වැදගත් තැනක් හිමිවන රටකි. ශ්‍රී ලංකාවට ද බුද්ධාගමේ පණිවිඩය ලැබුණු බව වංශකථාවෝ සඳහන් කරති. අශෝකයන්ගේ පුත් වු මහින්ද තෙරුන් වහන්සේ ඇතුලු පිරිස වැඩම කොට ඇත.[13] එවකට රජ කළ දේවානම් පියතිස්ස රජතුමා ඉතා උසස් අන්දමේන් බුදුදහම රාජ්‍ය ආගම බවට පත් කරගනිමින් තම දරුවන් ද ශාසනයට පූජා කරමින් බුද්ගාම රටේ ස්තාපිත කරන්නට කටයුතු සංවිධානය කරන ලදි. එතැන් පටන් වර්තමානය දක්වා ම දිවයිනේ ඉතිහාසයේ කැපී පෙනෙන භූමිකාවක් නියෝජනය කළ සංවිධානාත්මක පිරිසක් ලෙසින් සංඝ සංවිධානයේ ක්‍රියාකාරිත්වය ලංකා ඉතිහාසයේ සුවිශේෂ වැදගත්කමක් හිමි කර ගෙන ඇත. එබැවින් සංවිධිත වූ සංස්ථාවක් ලෙසින් භික්‍ෂු ශාසනය ගැන ඓතිහාසික දෘෂ්ටිකෝණයක් තුළින් බැලීමටත් කාලීන ව එහි ඇතිවන වෙනස්වීම් හා මතවාද ගැනත් එම මතවාද ශාසනය හා සමාජමය ආකල්ප කෙරෙහි ඇති කළ බලපෑම පිළිබඳවත් තුලනාත්මකව විමසීම ඉතා වැදගත්ය.

අනුරාධපුර මහා විහාරය ශ්‍රී ලාංකේය භික්‍ෂු සංස්ථාවේ ආරම්භක භික්‍ෂු මූලස්ථානය විය. එයින් බුදු දහමේ ආරක්‍ෂාව උදෙසා කැපවී කටයුතු කරන ලද අතර බුදුදහම ජන ජීවිතය සමග සම්බන්ධ කරන්නට බොහෝ සෙයින් කටයුතු කරන ලදි. ලාංකේය ආගමික හා සංස්කෘතික අංශවල සුවිශේෂි වර්ධනයක් ඇති කිරීමට මෙන්ම සමාජ ආර්ථික හා දේශපාලන පාර්ශ්ව ආගමික පදනමක් මත නව රටාවකට යොමුකරලීමට කෙරෙහිත්

ජාත්‍යන්තරිකව සංස්කෘතික සබඳතා ශක්තිමත් කරලීම උදෙසාත් දීර්ඝ කාලීනව මහත් දායකත්වයක් ලබා දුන් භික්ෂු සම්ප්‍රදායක් ලෙසින් මහාවිහාර සම්ප්‍රදාය හඳුන්වා දිය හැකිය. එතැනින් ආරම්භ වූ ශාසනය සිංහල රාජ්‍යයේ අවසානය වූ 19 වන ශත වර්ෂය දක්වාම මේ අතී දීර්ඝ කාලය තුළ සිංහල සිංහාසනයේ නිත්‍යානුකූල අයිතිය බෞද්ධයකුට ම මිස වෙන කිසිවකුටත් හිමි නොවන බැව් සිංහලයන්ගේ පිළිගැනීම විය. භික්ෂූන් වහන්සේ තම ප්‍රතිපත්ති සමාජ වෙනස්වීම මත වෙනස් මුහුණුවරකින් පවත්වාගෙන ගිය ආකාරයක් දිස් වූ රාජ්‍ය යුගයක් ලෙසින් දුටුගැමුණු රාජ්‍ය සමය (ක්‍රි.පූ 101-77) හැඳින්විය හැකිය. මේ අසහාය වීරයා ජාතියේත් ආගමේත් විමුක්තිය පිණිස කළ මාරාත්මක සංග්‍රාමයේ දී එකල විසූ මහරහතන් ප්‍රමුඛ සිංහල භික්ෂූහූ තමන්ගේ පාඩුවේ ආරාමවලට වී නොසිට ඉදිරියට අවුත් තමන්ගෙන් ඉටුවිය යුතු සියලු ම යුතුකම් ඉටු කළහ. දුටුගැමුණු කුමාරයාගේ ආරාධනා පරිදි රහතන් ප්‍රමුඛ මහා සංඝයා යුද්ධ හමුදාවත් සමග ම ඉදිරියට ගමන් කරන්නට පටන් ගත්හ. මහා සංඝයා වහන්සේලාගේ දැකීම මංගල්‍යයක් සහ ආරක්ෂාවක් වන බැව් දුටුගැමුණු කුමාරයා ප්‍රකාශ කෙළේය. එසේ ම සංඝයාගේ සහයෝගය දුටු රටවැසියෝ තවතවත් යුද්ධයට එක්වූහ. උන් වහන්සේලාගේ ආශිර්වාදය ලත් යුද්ධභටයෝ ප්‍රතියත්න ධෛර්යයෙන් සටන් කළහ.[14] යුද්ධයෙන් ජයගත් පසු දුටුගැමුණු රජතුමා අස්වසාලන්නට භික්ෂූන් වහන්සේලා ධර්මය දේශනා කළ අතර උන් වහන්සේලා ජාතික සංස්කෘතිය පිළිබඳව සියලු කාර්යයන්වල ප්‍රමුඛව ක්‍රියා කල බව නොඑක් උදාහරණවලින් පැහැදිලි වේ. විශේෂයෙන්ම ලොවාමහාපායේ සැලැස්ම සකස් කිරීම, රුවන්වැලිසෑයේ සැකැස්ම සකස් කිරීම වැනි කර්මාන්තයන්හී දී භික්ෂූන් වහන්සේ වටිනා කාර්යභාරයක් ඉටුකර දී ඇත. එපමණක් නොව රුවන්වැලි මහා සෑය ගොඩනැගීමේ දී ගඩොල් ලබා දීම ද භික්ෂූන් වහන්සේගේ අතින් සිදුවූ අවස්ථා ඇති බව මහාවංසයේ සඳහන් වේ.[15]



## සමාජ අභියෝග හමුවේ ශ්‍රී ලාංකේය භික්ෂූන් වහන්සේගේ කාර්යභාරයන්වල වෙනස්කම් ඇතිවීම

සමාජයේ ඇතිවන යම් යම් අර්බුදකාරී අවස්ථාවල දී භික්ෂූන් වහන්සේ ශාසන සම්ප්‍රදායන්ට හා ප්‍රතිපත්තිවලට හානියක් නොවන ලෙසින් ඒ අර්බුදයන් සමතයකට පත් කරන්නට කටයුතු කරන ලදී. විශේෂයෙන්ම රජුන් තේරීමේ දී ද භික්ෂූන් වහන්සේ මැදිහත් වී රටට උචිත රජෙකු පත් කරන්නට කටයුතු සලස්සවන ලදි. සද්ධාතිස්ස රජුගෙන් පසු සිංහාසනය ලජ්ජිතිස්ස රජුට හිමිවිය යුතු වුවත් එය මහා සංඝයාගේ කැමැත්තට අනුව ථුල්ලත්තන කුමරුට ලබා දීම[16], පළමුවන විජයබාහු මරණයෙන් පසු යුවරජුට රාජ්‍ය පැවැරීම භික්ෂූන් වහන්සේගේ මැදිහත්වීමෙන් සිදු වීම[17], රාජාධිරාජසිංහ රජුගේ මරණයෙන් පසු සිංහල සිංහාසනයට සුදුස්සෙකු ලෙස නායක ස්ථවිරයන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජකමට පත් කිරීම යනාදී අවස්ථා එයට නිදසුන් වේ. එමෙන්ම වළගම්බා රාජ්‍ය සමයේ රජු සමග ඇති කරගත් අමනාපයක් නිසා රජුන් හැරදා යන අමාත්‍යවරුන් මහාතිස්ස හිමියන්ගේ මැදිහත් වීමෙන් නැවත රජුන් සමග එකතු වී රටට සිදුවී ඇති විපත්වලින් රට මුදවා ගන්නා ලදී. ඒ වෙනුවෙන් උන් වහන්සේට කරන උපකාරයක් ලෙසින් අභයගිරි විහාරය කරවා පූජා කරන ලදී.[18]

වළගම්බා රාජ්‍ය සමයේ ඇති වූ බැමිණිටියාසාය නම් දුර්භික්ෂය හේතුවෙන් ලක්දිවට භයානක විපත්වලට මුහුණ දෙන්නට සිදුවිය. බොහෝ මිනිසුන් මෙන්ම භික්ෂූන් වහන්සේලාද ආහාර නැතිව මිය යන්නට විය. කටපාඩමෙන් ගෙන ආ ත්‍රිපිටක ධර්මය අතුරු දහන් වන්නට විය. මෙයින් සම්බුද්ධ ශාසනයට සිදුවන විපත පිළිබඳව කල්පනා කරන ලද මහතෙරවරුන් ප්‍රතිපත්තියත් ප්‍රතිවේධයටත් වඩා පර්යාප්තිය වැදගත්බව සලකා මාතලේ අලුවිහාරයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලදි.[19] මෙයින් පසුව විදර්ශනා ධූරයට වඩා ග්‍රන්ථධූරය උසස් කොට සලකන්නට විය. එහි ප්‍රතිපලයක් වශයෙන් භික්ෂූන් වහන්සේ ත්‍රිපිටක ධර්මය ඉගෙනීම, ඉගැන්වීම පමණක් නොව භාෂා ශාස්ත්‍රය, සාහිත්‍ය,

ඉතිහාසය, රාජනීතිය, වෙදකම යනාදි ශාස්ත්‍රීය සේවාවන් රැසකට මුල් විය. රටට වැඩ ඇති උගත් භික්ෂූන්ගේ නඩත්තුව සහ සැපපහසුව වෙනුවෙන් විශේෂ වැටුප් ද, මෙහෙකරුවන් ද, වියහියදම් ද, ආණ්ඩුව මගින් ලබා දුන්හ.[20]

යටත් විජිත පාලන සමය රටේ ප්‍රගතිය බිඳවැටුණු අඳුරු යුගයක් ලෙසින් පෙන්වාදිය හැකිය. ක්‍රි.ව 1505 පෘතුගීසි ආක්‍රමණයත්, ක්‍රි.ව 1602 ලන්දේසි ආක්‍රමණයත්, ක්‍රි.ව 1763 සිදු වූ ඉංග්‍රීසි ආක්‍රමණයත් සිංහල සංස්කෘතියත් සම්බුද්ධ ශාසනයත් විනාශ කිරීම සඳහා සිදුවු දීර්ඝකාලීන ආක්‍රමණයන් විය. මේ ආක්‍රමණ හමුවේ භික්ෂූන් වහන්සේට ශාසන ධර්මතා පූරණය කරමින් පසුවීමට නොහැකි විය. රාජ්‍ය අනුග්‍රහයක් නොමැතිවීම නිසාම ශාසනය පිරිහී ගියහ. උපසම්පන්න භික්ෂූන් වහන්සේ පස්නමක්වත් සොයා ගැනීමට නොහැකි විය. වැලිවිට ශ්‍රී පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේගේ මැදිහත් වීමෙන් නැවතවතාවක් ශාසනය නගා සිටුවන ලදි. ලන්දේසි ආක්‍රමණයෙන් පසු ඇති වූ ඉංග්‍රීසි ආක්‍රමණය අතිශය කෲර පාලන ක්‍රමයක් විය. ඔවුනගේ වද හිංසන හා අබෞද්ධ රාජ්‍ය පාලන ක්‍රමයක් යටතේ ජීවත්වීම භික්ෂූන් වහන්සේ ප්‍රතික්ෂේප කරන ලදි. එම නිසාම භික්ෂූන් වහන්සේලා ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව සටන් කිරීමට යුධ සේනාවන් සංවිධානය කරන ලදි. 1843 චන්ද්‍රජෝති ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ඇති වූ කැරැල්ල, කුඩාපොළ හාමුදුරුවන්ගේ සංවිධානයෙන් ඇති වූ කැරැල්ල ආදි අවස්ථාවන් කීපයක් මෙහිදී සිහිපත් කළ හැකිය. ආක්‍රමණිකයන්ගෙන් සම්බුද්ධ ශාසනයත්, සිංහල ජාතියත් ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙන් ජාතික මෙහෙවරට පණපෙවූ භික්ෂූන් අතර වාරියපොළ ශ්‍රී සුමංගල හාමුදුරුවන් වහන්සේ, මීගෙට්ටුවත්තේ ගුණානන්ද හාමුදුරුවන් වහන්සේ, වාරියපොළ ශ්‍රී සුමංගල හාමුදුරුවන් වහන්සේ, රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හාමුදුරුවන් වහන්සේ වැදගත් කොට සැලකිය හැකිය. උන් වහන්සේලා රටේ ස්වාධීනත්වයට හා ස්වරීභාවයට තම ශාසනික ප්‍රතිපත්ති පවා පසකටලා කටයුතු කළේ සියල්ලට පෙර රට වටින නිසාවෙනි.



භික්ෂූන් වහන්සේ සෘජුව දේශපාලනයට මැදිහත්වීම වර්තමානය වන විට සාකච්ඡාවට බඳුන්වී ඇති වැදගත් කරුණකි. භික්ෂුව අතීතයේ සිටම දේශපාලනයට මැදිහත් වු අවස්ථා ඉතිහාසය හැදෑරීමෙන් හඳුනාගත හැකිය. පක්ෂ දේශපාලනයේ දී රටේ සුභසිද්ධියට හානිවන ලෙස ප්‍රතිපත්ති සකස්කර ගනිමින් යම් පක්ෂයක් කටයුතු කරයි ද ඔවුන්ට එරෙහි වන්නට භික්ෂූන් වහන්සේලා බැඳී සිටියාහ. 1946 ජුනි 29 වන දින ලංකා එක්සත් භික්ෂුමණ්ඩලය පිහිටුවීම, ගොල්ෆේස්හී පවත්වන්නට යෙදුන දේශපාලන මහා සභාවක වල්පොල රාහුල හිමියන් විසින් කථාවක් පැවැත්වීම, විද්‍යාලංකාර මහා පිරිවෙන් ප්‍රකාශය, කැලණි විහාරයේ ප්‍රකාශය භික්ෂුව දේශපාලනයේ නිරතවීම සම්බන්ධයෙන් ඇති අවස්ථා මෙහිදී ඉතා වැදගත්කොට සැලකිය හැකිය.

වර්තමානය වන විට භික්ෂූන් වහන්සේ පක්ෂ දේශපාලනයේ මැදිහත්කරුවන් පමණක් නොව ව්‍යවස්ථාදායක නියෝජනය කරන දේශපාලන නියෝජිතයින් ලෙසින් ද තේරීපත් වී පර්ලිමේන්තුවේ කටයුතු කරයි. මේ පෙරලිය භික්ෂු සමාජයේ සිදු නොවියයුත්තක් සෙයින් විද්වත් මතයයි. වෙනස්වන සමාජයට ගැලපෙන ලෙස භික්ෂූන් වහන්සේ වෙනස් විය යුතු වුවත් තරගකාරී දේශපාලන රටාව තුළ භික්ෂූන් වහන්සේ ක්‍රියාකාරීවීම භික්ෂූ ප්‍රතිපත්තිවලට හා සමාජයෙන් ලැබියයුතු ගෞරවයට යම් හානියක් සිදුවනු ඇත. නූතනය වනවිට සමාජය බොහෝ වේගයෙන් තාක්ෂණය අතින් දියුණුවක් උදාකරගෙන සිටිනු දැකිය හැකි අතර භික්ෂූන් වහන්සේ ද ඒ තාක්ෂණය භාවිතයේ දී සමත්කමක් දක්වන ආකාරයක් දැකිය හැකිය. රටක සුබසිද්ධිය ගොඩනගන අධ්‍යාපනික, සමාජ, ආගමික, සංස්කෘතික යන ක්ෂේත්‍රයන් හී සුවිශාල සේවාවක නිරතව මානව සමාජයේ ප්‍රගමනයට යම් දායකත්වයක් සිදුකරන ආකාරයක් නූතන භික්ෂු සමාජය තුළින් පෙනෙන කාරණයකි.

## නිගමනය

සමාජයේ යම් යම් කාලයන්හී ඇතිවන වෙනස්කම් මත භික්ෂූන් වහන්සේගේ ජීවිතවලද යම් වෙනස්වීම් සිදුවීම බුද්ධ කාලයේ මෙන්ම ඉන්පසුත් ඇතිවූන බව පැහැදිලිව පෙනෙන කරුණකි. බුද්ධ දේශනාව තුළින් භික්ෂු ප්‍රතිපත්තිවලට උචිත ආකාරයේ වෙනසක් සිදුකරගැනීමට අවස්ථාව ලැබී තිබිණි. ඒ අනුව අතීතයේ සිටම භික්ෂූන් වහන්සේ යම් යම් වෙනස්කම්වලට ලක්විය. බුද්ධ දේශනාවේ විනාශයට හෝ සංඝ ශාසනයේ විනාශයට එම පරිවර්තනයන් හේතු නොවීය. එම සියලු කරුණු අනුව පැහැදිලි වන්නේ එම වෙනස්වීම් මත තමන්ගෙන් සමාජයට සිදුවිය යුතුකම් හා වගකීම් පුළුල් වන බවත්ය.

## ආන්තික සටහන්

1. දීඝ නිකාය 1 සාමඤ්ඤඵල සූත්‍රය, බු.ජ.පු.මු, පිට 110.
2. මජ්ඣිම නිකාය, චූල සීහනාද සූත්‍රය, බු.ජ.පු.මු, පිට 158.
3. සංයුත්ත නිකාය 1, භික්ඛක සූත්‍රය, බු.ජ.පු.මු, පිට 326.
4. මජ්ඣිම නිකාය. 1, මහාතණ්හා සංඛය සුත්ත, බු.ජ.පු.මු, පිට 628.
5. මහා වග්ග පාලි 1, මහාක්ඛන්ධක, බු.ජ.පු.මු, පිට 42.
6. මහාවග්ග පාලි, චීවරක්ඛන්ධකය, බු.ජ.මු.පු, පිට 674
7. පාචිත්තිය පාලි, ගණභෝජනාසික්ඛාපද, බු.ජ.පු.මු, පිට 204
8. මහාවග්ග පාලි, චීවරක්ඛන්ධකය, බු.ජ.මු.පු, පිට 674
9. සමන්තපාසාදිකා I, පිට 19.
10. මහාවංශය පිට V, පිට 1-13.
11. රාහුල හිමි වල්පොල, භික්ෂුවගේ උරුමය, (2012), ගොඩගේ ප්‍රකාශන, මරදාන, පිට 13.
12. සමන්තපාසාදිකා I, පිට 37.
13. දීපවංශය පරි. 8, ගාථා 12, පිට 31.
14. මහාවංශය, xcvi, පිට 16.
15. මහාවංශය, xxx, පිට 98.
16. මහාවංශය, xxxiii, පිට 18.
17. මහාවංශය, lxi, පිට 1-3.
18. මහාවංශය, xxxii, පිට 35-94.
19. රාහුල හිමි, 2012, පිට 26.
20. මහාවංශය, xxxvii, පිට 149.